## අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015
## සිංහල භාෂාව හා සාහිත්‍යය I
## පිළිතුරු සඳහා මග පෙන්වීම

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 2 | 21 | 4 |
| 2 | 3 | 22 | 1 |
| 3 | 4 | 23 | 3 |
| 4 | 1 | 24 | 1 |
| 5 | 3 | 25 | 3 |
| 6 | 2 | 26 | 2 |
| 7 | 3 | 27 | 4 |
| 8 | 4 | 28 | 3 |
| 9 | 3 | 29 | 4 |
| 10 | 1 | 30 | 2 |
| 11 | 3 | 31 | 3 |
| 12 | 2 | 32 | 4 |
| 13 | 2 | 33 | 3 |
| 14 | 4 | 34 | 2 |
| 15 | 1 | 35 | 3 |
| 16 | 1 | 36 | 1 |
| 17 | 3 | 37 | 1 |
| 18 | 2 | 38 | 4 |
| 19 | 4 | 39 | 2 |
| 20 | 3 | 40 | 3 |

**(ලකුණු 1 x 40 = 40)**

2 වන පිටුව බලන්න

# අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015
## සිංහල භාෂාව හා සාහිත්‍යය II
## පිළිතුරු සඳහා මග පෙන්වීම

1. (i) නාසික්‍ය අක්ෂර - ඞ, ඤ, ණ, න, ම, ං, ඥ
උෂ්මාක්ෂර - ශ, ෂ, ස, හ, ෆ
නාසික්‍ය අක්ෂර හා උෂ්මාක්ෂර දෙක බැගින් ලියා ඇත්නම් ලකුණු දෙකක් ලබා දෙන්න.

(ii) (අ) දුෂ්කර - සුකර
(ආ) සමීපස්ථ - දූරස්ථ

(iii) (අ) පද්දතිය - පද්ධතිය
(ආ) පෝශණ - පෝෂණ

(iv) (අ) වෛද්‍යවරුන් නිසා අසරණ රෝගීහු ඉක්මනින් සුවය ලබති.
(ආ) සුප්‍රකට ලේඛිකාවක වන්නේ කෙසේ ද?

(v) සිට, පසු

(vi) (අ) ගොන් කවඩි හැල්ල - මයිනන් නගන සෝෂාව
(ආ) කිලං හැළිය - අපිරිසිදු වතුර දමන භාජනය

(vii) (අ) ප්‍රසාදය - සතුට
(ආ) ප්‍රාසාදය - මාලිගය
මේ අරුත් පැහැදිලි වන සේ ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය දෙකක් සම්පාදනය කර ඇත්නම් ලකුණු දෙන්න.

(viii) (අ) මව විසින් දරුවෝ රකිනු ලැබූහ/ ලැබූ/ ලැබුවෝය/ ලදහ/ ලද්දෝය/ ලද්දාහ/ ලදූ
(ආ) වෙද මහතා විසින් රෝගියෙක් සුවපත් කෙරේ/ කරනු ලැබේ/ කරනු ලැබෙයි.

(ix) (අ) කිරිබත් - සමාස / විභක්ති සමාසය
(ආ) උදෙසා - නිපාත

(x) (අ) බිරිඳක් - බිරිඳක
(ආ) විද්වත්හු - විද්වතුන්

**(එක් නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 20 යි)**

2. (අ) ක්‍රීඩාවෙන් සිදුවන යහපත
ක්‍රීඩාව දියුණු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

(ආ) වන අලි විපත් වළක්වා ගැනීම
වන අලි ගම් වැදීමෙන් මිනිස් ජීවිතවලට ඇති වන හානිය වළක්වා ගැනීම

(ඉ) මාර්ග අනතුරු නිසා අකාලයේ අහිමිවන මිනිස් ජීවිත
මාර්ග අනතුරු වළක්වා ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ගයක් ගැනීමේ අවශ්‍යතාව

(ඊ) ආහාර නිෂ්පාදකයන් මුහුණපාන ගැටලු
පෞද්ගලික අංශයේ සූරා කෑමෙන් ගොවියා ආරක්ෂා කිරීම

රචනය - ලකුණු විග්‍රහය

* සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළු ව — ලකුණු 08 යි
* සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය — ලකුණු 12 යි
* ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම — ලකුණු 05 යි

**(මුළු ලකුණු 25 යි)**

3 වන පිටුව බලන්න

- ★ **සාරවත්භාවය** ලකුණු 07

**විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම** ලකුණු 01

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරු බව හා සම බව, වචන ගණන 250 සමීපව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

- ★ **සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය** ලකුණු 12

මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතු ය.

- ★ **ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම** ලකුණු 05

වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

3. සාරාංශය

අන්තර්ගතය - ලකුණු 06
වචන ගණන - ලකුණු 02
ශිල්පීය දක්ෂතා - ලකුණු 02

**අපේක්ෂිත ප්‍රධාන අදහස්**

- ★ පැහැදිලි අරමුණක් නොමැති ව කෘෂිකර්මය ඉගැන්වීමට සැලැස්මක් ඇති කිරීම.
- ★ ඒ සඳහා විශේෂඥ උපදෙස්, ස්ථාන ආදිය පිළියෙල කිරීම.
- ★ ගුරුවරුන් පුහුණු කිරීම, පාඨමාලා, නිර්දේශ පත්‍ර, ගුරු අත්පොත් සුදානම් කිරීම.
- ★ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා මුදල් වෙන් කිරීම.
- ★ අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග සඳහා විෂයයක් වශයෙන් කෘෂිකර්මය අනුමත කිරීම.
- ★ ශිෂ්‍යයන් අතර කෘෂිකර්මය ජනප්‍රිය විෂයයක් නො වීම.

සාරාංශය තනි ඡේදයක් වශයෙන් ලියා තිබිය යුතු ය. ඡේද බෙදා ඇත්නම් ශිල්පීය දක්ෂතාවලින් ලකුණක් අඩු වේ.

**(මුළු ලකුණු 10 යි)**

4. i. (1) සමාජ විෂමතා නැති කිරීම
(2) සදාචාරාත්මක සංස්කෘතියක හිමිකරුවන් වීම
(3) රටේ දියුණුවට රුකුළක් වීම
සම්පූර්ණ ලකුණු සඳහා කරුණු තුන ම ලියා තිබීම අවශ්‍ය වේ. කරුණු දෙකක් පමණක් තිබේ නම් ලකුණු එකකි. එක් කරුණක් ඇත්නම් ලකුණු නො ලැබේ.

ii. වැඩිහිටියන් විසින් බාල පරම්පරාවට උරුම කර දෙනු ලබන්නා වූ සියලු ම පාරිසරික හා මානසික ක්‍රියාවලිය

iii. අවශ්‍ය දැනුම, අත්දැකීම්, යහපත් ආකල්ප, නිපුණතා වර්ධනය
(මින් කරුණු දෙකක් පමණක් තිබීම ප්‍රමාණවත් ය.)

iv. ජනගහන වර්ධනය හා නාගරික බලපෑම

v. පවුල හා ජන සමාජය අතර සම්බන්ධතාව ලිහිල් වීම පාදක කොට ගත් පරිසරයක් යටතේ හැදෙන වැඩෙන ළමයාට ජීවත් වීමේ දී ගැටලු හා ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදු වීම. එනිසා කාංසාව බිය ලැජ්ජාව වැනි අයහපත් චිත්තවේගවලට ගොදුරු වීම.

**(එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10 යි)**

4 වන පිටුව බලන්න

05. * ප්‍රායෝගික ලේඛන
* අයදුම් පත්‍රය

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.

1. ආකෘතිය - ලකුණු 04
2. අන්තර්ගතය - ලකුණු 08
3. ශිල්පීය දක්‍ෂතා - ලකුණු 03

01. ආකෘතිය (ලකුණු 04 යි)

මාතෘකාව - ලකුණු 01
ආකෘතිය (අයදුම් පත්‍රයක ස්වරූපය) - ලකුණු 01
අත්සන - ලකුණු 01
දිනය - ලකුණු 01

02. අන්තර්ගතය (ලකුණු 08 යි)

| | | | |
|---|---|---|---|
| නම | 01 | ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම | 01 |
| ලිපිනය | 01 | අවුරුදු 35ට අඩු වීම | 01 |
| උපන්දිනය | 01 | අධ්‍යාපන සුදුසුකම් | 01 |
| හැඳුනුම්පත් අංකය | 01 | පරිගණක විෂය පිළිබඳ පළපුරුද්ද | 01 |

03. ශිල්පීය දක්ෂතා (ලකුණු 03 යි)

නිවැරදි අක්ෂර වින්‍යාසය - ලකුණු 01
පැහැදිලි අත්අකුරු - ලකුණු 01
සම්මත පද බෙදීම - ලකුණු 01

නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් හා අදාළ කරුණු අන්තර්ගත නොවන උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

**නැතහොත්**

රාජකාරි ලිපිය : මුළු ලකුණු 15 යි.

1. ආකෘතිය - ලකුණු 04
2. අන්තර්ගතය - ලකුණු 08
3. ශිල්පීය දක්‍ෂතා - ලකුණු 03

ආකෘතිය :
* යවන්නාගේ නම, තනතුර, ලිපිනය සහ දිනය - ලකුණු 01
* ලබන්නාගේ ලිපිනය - ලකුණු 01
* ආමන්ත්‍රණය - ලකුණු 01
* මාතෘකාව හා අත්සන - ලකුණු 01

අන්තර්ගතය :
* සංවිධානය පිහිටුවීමේ අරමුණ - ලකුණු 02
* යෝජිත වැඩපිළිවෙළ - ලකුණු 02
* මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ ප්‍රධානත්වය - ලකුණු 02
* ආරාධිත දේශනය - ලකුණු 02

ශිල්පීය දක්‍ෂතා :
* නිවැරදි අක්ෂර වින්‍යාසය උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත් අකුරු, සම්මත පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ජේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.
* නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් හා අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

5 වන පිටුව බලන්න

The National e-learning Portal for The General Education

# අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015
## සිංහල භාෂාව හා සාහිත්‍යය III
## පිළිතුරු සඳහා මග පෙන්වීම

1. (i) (අ) 'අපටත් දවසක ඉර පායාදෝ' කෙටි කතාවේ සිරියාවතී පද්මා මිස්ට පාට පෙට්ටිය පෙන් වූ අවස්ථාව
(ආ) ඒ.වී. සුරවීර මහතා

(ii) (අ) පූජාවලිය
(ආ) රජගහනුවර අසූ කෙළක් ධන ඇති සිටාණන්ගේ හිස් මුල් කන පණුවන් දෙදෙනා, සැත් තුඩින් ගෙන පෙන්වීම

(iii) (අ) සුදු යම් දෙයක් සිදුවෙයි මම දුටු සීනේ
සුදසුන් නිරිඳුනේ මොකදැයි ඔය සීනේ
(ආ) තුන් සරණ, වදන් කවි පොත, ගණදෙවි හැල්ල, වෙසතුරු දා කව, සොකරි කවි කතාව, වඩිග හටන, රති රත්නාලංකාරය, සුමුගු දා කව (කාව්‍ය ග්‍රන්ථ දෙකක් දැක්වීම ප්‍රමාණවත් ය)

(iv) (අ) අභය රාජ කුමාරයා/ බිම්බිසාර රජුගේ පුත්‍රයා/ ජීවක හදා වඩා ගත් තැනැත්තා
(ආ) සාකේත නුවර සිටු දේවියට පිළියම් කර ජීවක ලබා ගත් සම්පත්

(v) (අ) සඳකිඳුරු දා කව
(ආ) කුරුණෑගල යුගය

(vi) (අ) මඟුල් ප්‍රස්තාව නාට්‍යයේ නන්දාවතී
(ආ) ලව්නේරිස්ට

(vii) (අ) සද්ධර්මාලංකාරය
(ආ) දෙවන ධර්මකීර්ති සංඝරාජ හිමි

(viii)(අ) මල්සර හට හී සපයන්නී
(ආ) අරිසෙන් අහුබුදු මහතා

(ix) (අ) මහලු බමුණා
(ආ) සත්තුභත්ත ජාතකය

(x) (අ) කිසාගෝතමියක
(ආ) කොළඹ යුගයේ 70 දශකයේ මැද භාගය / කොළඹ යුගය

**(ලකුණු 2 x 10 = 20 යි)**

2. (අ) නූවෙන් - නොවූයෙන්
පසුපෙය - පොලිය
අපට අයත් ධනයක් නැත. එසේ ම පොලිය ගෙවන්නට මාර්ගයක් ද නැත. ණය ගෙවීමට දැන් කෙනෙක් නැත. නමුත් ඒ වෙනුවට දීමට යමක් ඇත.

(ආ) කර්මාන්විත වූ - කර්මයට අනුව ඇතිවන / පවත්නා
අන්තර්ධාන - අතුරුදහන් වන / නැති වන
ඒ කාලයේ, කර්මයට අනුව පවත්නා රෝග හැර වෙනත් රෝග එක් බෙහෙත් ආලේපයක ප්‍රමාණයකින් පමණක් නැති වී යන තරම් දිව්‍යමය බෙහෙත් වර්ග උගන්වන සක් දෙවියන් විසින් ජීවකට සත් අවුරුද්දක් ඇතුළත වෙදකම පුහුණු කර අවසන් කරන ලදි.

(ඉ) රත පොරවන්නී - ජම්බු ගස්වල ගෙඩි ඉදී රතු පැහැ ගැන්වී ඇති බව
ලෝ කත - ලෝකය නමැති කාන්තාව
ජම්බු ගස් පුරා රත් පැහැයෙන් එල ඉදෙයි. බක් මී ගහ කහ පැහැ මලින් බර වෙයි. අඹ ගස් පුරා ලා රත් පැහැ දලු හට ගනී. ලෝකය නමැති කාන්තාව මේ ලෙස විචිත්‍රවත් කර ලන්නීය.

6 වන පිටුව බලන්න

(ඊ) නිස්කාරණයෙහි - නිකරුණේ
අස්ථානයේ - නුසුදුසු තැනක
එනිසා නිසැකයෙන් ම තමන්ට දියුණුවක්, යහපතක් සඳහා සත්වයන් තැනට සුදුසු නුවණින් තොර ව කටයුතු කිරීම නිසා ගුරුවරයා මෙන් මහා විනාශයට පත්වෙති'යි සිතා මහ බෝසතාණන් දේශනා කරන්නේ අපගේ ගුරුතුමා තැනට සුදුසු නුවණින් ක්‍රියා නොකර නුසුදුසු තැනක දී උපාය රහිත ව උත්සාහ කරමින් ......./

ස්ථිරවම උපායක් නැතිව නිකරුණේ දියුණුවක් ප්‍රාර්ථනා කරන සත්ත්වයන් ගුරුවරයා මෙන් විනාශයට පැමිණෙති'යි සිතා බෝසතාණන් තම ගුරුතුමා නුසුදුසු අවස්ථාවේ වීර්ය කරමින් .......

**(ලකුණු 5 × 4 = 20 යි)**

3. (අ) කවි පන්තියේ සාර්ථකත්වයට හේතු වූ නිර්දිෂ්ට අංශ ආශ්‍රයෙන් කරුණු දැක්වීම අවශ්‍ය වේ. පහත සඳහන් නිදසුන් මෙහි දී අදාළ වේ.

- ★ පුංචි බේබි එක්කල පාසල් යන්නයි මෙහි ආවේ
- ★ බේබිගෙ අත අල්ලාගෙන උදේට පාසල් යනවා
  බේබිගෙ අත අල්ලාගෙන හවසට ගෙදරට එනවා
- ★ තුනේ ඉඳපු පුංචි බේබි හතරේ පංතියට ගිහින්
  තුනේ ඉඳපු මම හතරට යන්නේ කවදාදා ඉතින්

යන ආදී වෙනත් සුදුසු උදාහරණ

(ආ) සරල බස් වහරක් යොදා ගැනීමට අදාළ ව නිදසුන් දැක්වීම අවශ්‍ය වේ.

- ★ හතේ අටේ චක්කරයෙන් ගණන් හදා සමත් වෙලා
  පොතේ තියෙන කතා කියා පාඩම් දී සමත් වෙලා
- ★ ලේනා ගැන පූසා ගැන කවි කියලා සමත් වෙලා
- ★ හවසට අත්වැල් බැඳ ගෙන කවි කියන්නෙ අපි දෙන්නා

වැනි වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.

The National e-Learning Portal for The General Education

**නැතහොත්**

(අ) පහත දැක්වෙන පරිදි හාස්‍යය ජනිත වන අවස්ථා ඉදිරිපත් කිරීම යෝග්‍ය වේ.

- ★ තෙපානිස්ගේ නිවසට පැමිණි ලව්නේරිස් හැසිරෙන ලැජ්ජාශීලී ස්වභාවය හා කරන කතා බහ
- ★ පැමිණි කාරණය අමතක කොට වෙනත් කරුණු කතා කිරීම
- ★ විවිධ මාතෘකා ඔස්සේ රණ්ඩු කරමින් සිට ලව්නේරිස් මැරුණු බව සිතා නන්දාවතී ඉකි බිඳ හැඬීම
- ★ හදිසියේ විවාහය සිදු කිරීමට තීරණය කිරීම

(ආ) යෝග්‍ය අවස්ථා නිරූපණයේ දී පහත දැක්වෙන කරුණු ගැන අවධානය යොමු කළ හැකි ය.

- ★ ලව්නේරිස් නන්දාවතීගේ නිවසට පැමිණි අවස්ථාව
- ★ ලව්නේරිස් හමුවීමට නන්දාවතී පැමිණීම
- ★ ගෝනහේන අයිතිය පිළිබඳ ගැටුම් අවස්ථාව
- ★ හඳයා හා වල්ලියා සම්බන්ධයෙන් ගැටුම් ඇති කර ගැනීම
- ★ ලව්නේරිස් යාමට සැරසෙන අවස්ථාව
- ★ ලව්නේරිස් අසනීප වන අවස්ථාව
- ★ ලව්නේරිස් මියගොස් ඇතැයි සිතා කෙරෙන ප්‍රකාශ

**(ලකුණු 15 යි)**

7 වන පිටුව බලන්න

4. (අ) කථා රසය කුළු ගැන්වෙන අයුරින් චරිත හැසිරවීම ආශ්‍රිත ව පහත දැක්වෙන පුද්ගලයන් ගැන කරුණු ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

**ගන්ධක සිටාණන්ගේ චරිතය**

- ★ ගන්ධක සිටාණන් හා භාණ්ඩාගාරික ලේකම් අතර අතර ඇති වන කතා බහ
- ★ ධනය පරිභෝජනය කර අවසන් කිරීමට සිතූ සිටාණන් ඒ සඳහා බත් කන මණ්ඩපයක් ඉදි කිරීමට වියදම් කිරීම
- ★ පිරිසර වැසියාට බත් දීමට අකමැති වීම

වැනි වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.

(ආ) **හත්ත හත්තික සිටුවරයාගේ චරිතය**

- ★ ගන්ධක සිටාණන්ගේ බත් තලියෙන් බත් පිඩක් කෑමට ආශාව
- ★ බත් තලියක් අපේක්ෂාවෙන් කරන සේවාව
- ★ එසේ ලබා ගත් බත් තලිය පසේ බුදුන් වහන්සේට දන් දීම
- ★ තමා හිමි කර ගත් පින් අන් අයට ලබා දෙන ආකාරය

වැනි වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.

**නැතහොත්**

මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී පහත දැක්වෙන කරුණු ගැන අවධානය යොමු කළ යුතු වේ.

(අ) පාඨකයාගේ කුතුහලය දනවන අයුරින් කතාව ඉදිරිපත් කිරීම

- ★ නිධානය සියල්ලට පෙනෙන සේ උතුරා ලූ වැවේ දියපිට පෙරළි පෙරළී යාම
- ★ ගැහැනියගේ එක් අතක් නිධානයේ ඇල වීම
- ★ ඇඳි ඉණකඩ පවා නිධානයට ඇමීම
- ★ නිධානය පෙරළි පෙරළි ගොස් උන්ගේ ගෙදර සිට ගැනීම

වැනි වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.

(ආ) සිද්ධි ගැළපීමේ අනුපිළිවෙළ

- ★ ගොපලු දරුවා කටු අලය පූජා කිරීම
- ★ කටු අලය පූජා කිරීමේ පිනෙන් නිධානය පහළ වීම
- ★ නිධානය සියල්ලන්ට ම පෙනෙන සේ උතුරා ලූ වැව දිය පිට පෙරළීම
- ★ ගැහැනිය නිධානය දැකීම
- ★ නිධානය බැලීමට මිනිසුන් පැමිණීම
- ★ නිධානය ස්ත්‍රිය ඉදිරියේ සිට ගැනීම යනා දී ලෙස

වැනි වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.

**(මුළු ලකුණු 15 යි)**

5. මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී පහත දැක්වෙන දුර්වලතා පිළිබඳ සැලකිය හැකිය.

- ★ අකීකරු බව
- ★ දැඩි ලෝභය
- ★ අන්‍ය අදහස් ගරු නො කිරීම
- ★ තැනට සුදුසු ලෙස ක්‍රියා නො කිරීම
- ★ දුර දිග නො බලා ක්‍රියා කිරීම

මෙම දුර්වලතා හෙළිවන අවස්ථා කීපයක් පහත දැක්වේ.

- ★ වේදබ්භ බමුණා උගතෙකු වුවත් අන්තේවාසිකයාගේ උපදෙස් නො තකා දුර දිග නො බලා සත් රුවන් වැසි වැස්ස වීම
- ★ පළමු සොරු කණ්ඩායම සත් රුවන් ලබා ගැනීමට වේදබ්භ බමුණා දෙවන සොරු කණ්ඩායමට භාර දීම
- ★ වස්තුව අයිති කර ගැනීම සඳහා එකිනෙකා අරගල කිරීම
- ★ අවසානයේ ඉතිරි වන දෙදෙනාගේ සිතුම් පැතුම්වල ස්වභාවය
- ★ වස්තු තණ්හාව සියල්ලගේ ම විනාශයට හේතු වූ අයුරු

**(මුළු ලකුණු 10 යි)**

8 වන පිටුව බලන්න

6. වැසි අවස්ථාවකදී පරිසරයේ ඇති වන වෙනස්කම් වාක් චිත්‍ර මවමින් විචිත්‍රාකාරයෙන් ඉදිරිපත් කිරීම මෙහි දී අවශ්‍ය වේ. පහත දැක්වෙන කරුණු වැදගත් වේ.
   - ★ අහසේ වළාකුළු හා තරගයක යෙදේ
   - ★ ගස්වැල් තිගැස්සෙයි මේ කුළු ගැටෙන හඬින්
   - ★ දියවැල් වමාරන්නා මෙනි පියසි තල
   - ★ පිඹුරන් සේ ඇදෙයි ගුරු පැහැ දිය දාරා

   වෙනත් උදාහරණ ද සැලකිල්ලට ගන්න.

**(මුළු ලකුණු 10 යි)**

7. සමාජයේ පවත්නා පන්ති විෂමතාව සිත් ගන්නා ආකාරයෙන් නිරූපණය කිරීම නිසා කෙටිකතාවේ සාර්ථකත්වය රැඳී ඇති ආකාරය දැක්වීම අවශ්‍ය වේ. පහත දැක්වෙන නිදසුන් ප්‍රයෝජනවත් වේ.

   - ★ බාබුජීගේ මැණියන් රාසුල් ජූ දුටු ආකාරය
     දිළින්දන් කෙරේ හෙළන අකාරුණික දෘෂ්ටිය

   - ★ බාබුජීගේ ධනපති තත්ත්වය
     "මගේ වැදගත් ධනපති තත්ත්වය ගැන කල්පනා වූ මට ලැජ්ජාවක් ඇති විය. බටහිර පන්නයේ ඇඳුම් ඇඳ සිටින මට බර පොත් මිටියකුත් උසුලා ගෙන ගමන් කළ හැකි ද?" ආදී ප්‍රකාශන

   - ★ ධනය සපයන්නෝ අසරණ නිර්ධනයන්ව වංචාවෙන් රවටමින් සිය ධනය වර්ධනය කර ගනිති.

   - ★ කථිකයා හා රාසුල් ජූ අතර ඇතිවන කතා බහෙන් ජාති වාදයෙන් හා ආගම් වාදයෙන් බැටකමින් රාසුල් ජූ සරණාගතයෙකු බවට පත් වූ පුවත

   - ★ "අන් හැම කොන්ත්‍රාත්කරුවෙකු මෙන් ම මේ මිනිහා ද හොර ගෙඩියෙකි. සිය කුලී කරුවන්ගෙන් දවල් රෑ දෙකේ ම වහලුන්ගෙන් මෙන් වැඩගත් මේ මිනිහා"

   - ★ රුපියලක් දෙකක් විතර. වැස්සොත් එහෙම කීයක් වත් නෑ" ආදී ප්‍රකාශන මෙහිදී අදාළ වේ.

**(මුළු ලකුණු 10 යි)**